# ආරක්ෂක අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

# ලංසු ආරාධනය (IFB)

## ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ MI-171E හෙලිකොප්ටර් පිරිවැඩියාවන් (OVERHAUL) සහ Bell 212 හෙලිකොප්ටර් සඳහා ප්‍රතිසාධනය (RECOVERY) වෙනුවෙන් අමතර කොටස් මිලදී ගැනීම

1. ආරක්ෂක අමාත්‍යාංශයේ ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක ලේකම් වෙනුවෙන් **"ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ MI-171E හෙලිකොප්ටර්වල පිරිවැඩියාවන් (OVERHAUL) සහ Bell 212 හෙලිකොප්ටර් සඳහා ප්‍රතිසාධනය (RECOVERY) වෙනුවෙන් අමතර කොටස් මිලදී ගැනීම"** සඳහා යෝග්‍යතාපූර්ණ දේශීය හා ජාත්‍යන්තර ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී. ප්‍රසම්පාදනයේ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රසම්පාදන හැඳුනුම් අංකය | විස්තරය | ලංසු සුරක්ෂණය වටිනාකම හා කාල සීමාව | ලංසු ලේඛන නිකුත් කිරීමේ අවසන් දිනය | නැවත නොගෙවන ගාස්තුව(රු.) | ලංසු භාරගැනීම අවසන් කිරීමේ දින සහ වේලාව | ලංසු භාරගැනීම විවෘත කිරීමේ දින සහ වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | AHQ/24/-FR/M17/1007 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ SMH 4421 MI-171E හෙලිකොප්ටරයෙහි පිරිවැඩියා සිදු කිරීම.(Overhaul) S/No : 171E0014411 6003U | 2025 ඔක්තෝම්බර් 07 රු.18,192,000.00 | 2025 මාර්තු 17 | 100,000.00 | 2025 මාර්තු 18 1100 පැයට | 2025 මාර්තු 18 1200 පැයට |
| 02 | AHQ/24/-FR/M17/1006 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ SMH 4426 MI-171E හෙලිකොප්ටරයෙහි පිරිවැඩියා සිදු කිරීම.(Overhaul) S/No : 171E0014411 6007U | 2025 ඔක්තෝම්බර් 07 රු. 18,192,000.00 | 2025 මාර්තු 17 | 100,000.00 | 2025 මාර්තු 18 1100 පැයට | 2025 මාර්තු 18 1130 පැයට |
| 03 | AHQ/24/FS/-BEL/1030 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ SUH-560 Bell 212 හෙලිකොප්ටරය සඳහා ප්‍රතිසාධනය (Recovery) වෙනුවෙන් අමතර කොටස් ලදී ගැනීම | 2025 අගෝස්තු 12 රු. 10,000,000.00 | 2025 මාර්තු 17 | 100,000.00 | 2025 මාර්තු 18 1100 පැයට | 2025 මාර්තු 18 1100 පැයට |

2. ලංසු කැඳවීම **ජාත්‍යන්තර තරඟකාරිත්ව ලංසු පටිපාටියට** (ICB) අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත 1 ඡේදයේ සඳහන් ප්‍රසම්පාදනය වෙනුවෙන් දක්වා ඇති නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවා **2025 පෙබරවාරි මස 03 දින** සිට සෑම වැඩකරන දිනයකම 1 ඡේදයේ දක්වා ඇති ලංසු නිකුත් කිරීමේ අවසන් දින දක්වා සතියේ වැඩකරන දිනවලදී **1000 පැයේ සිට 1500 පැය දක්වා, ප්‍රධාන මූල්‍ය නිලධාරී** 1, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිල දී ගත හැක. තවද, **1000 පැයේ සිට 1500 පැය දක්වා** ප්‍රසම්පාදන අංශය, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙතින් (**දුරකථන**- +94112390719, **ෆැක්ස්** +94112390720, **ඊ-මේල්** (procurement@defence.lk) ගාස්තු රහිතව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි අතර නැවත ගෙවනු නොලබන **ගාස්තුව මුදලින් ගෙවිය යුතු වේ.**

4. උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන්හට ලංසු ලේඛන මිල දී ගත් පසු **2025 පෙබරවාරි 03 සිට 2025 මාර්තු 17 දක්වා** සෑම වැඩ කරන දිනකම **පැය 0900 සිට පැය 1500 දක්වා** අතර කාලයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුනායක කඳවුරේදී MI-171E හෙලිකොප්ටර් යානා පරීක්ෂා කිරීමට අවසර ඇත.

5. සම්පූර්ණ කරන ලද ලංසු යෝජනාව ටෙන්ඩර් හැඳුනුම් අංකය සලකුණු කර, 1 **ඡේදයේ** දක්වා ඇති දිනය හා වේලාවට හෝ ඉන් පෙර පහත ලිපිනයට කූරියර් මාර්ගයෙන් එවීමට/භාරදීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, සහභාගී වීමට අපේක්ෂා කරන ලංසුකරුවා/ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ඉහත අංක 1 ඡේදයේ දක්වා ඇති දිනය හා වේලාවේදී පහත ලිපිනයෙහි ලංසු විවෘත කරනු ලැබේ. ලංසු භාරගැනීමේ වේලාව ඉකුත් වීමෙන් පසුව කිසිදු ලංසුකරුවෙකුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට ලංසු විවෘත කිරීම සඳහා සහභාගී වීමට අවසර නොලැබේ.

   ප්‍රසම්පාදන ශාඛාව
   2 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
   ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව

6. සියලුම ලංසුකරුවන් ඉහත ඡේද අංක 1 හි සඳහන් වටිනාකම සහ කාල සීමාව සඳහා පළමු ලිඛිත ඉල්ලුම මත මුදල් කල හැකි සහ කොන්දේසි විරහිත ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. එම සුරක්ෂණය ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් ලබා ගත යුතු අතර, බැංකු සුරක්ෂණය **"ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්"** නමින් යොමු කළ යුතුය.

7. වැඩි දුර තොරතුරු සඳහා ලංසුකරුවන්ට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නිලධාරියා සමග සම්බන්ධ විය හැකිය.

ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී
ප්‍රසම්පාදන අංශය
LL2 මහල, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,
තැ.පෙ. 594, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
දුරකථනය - +94112347694, +94112441044 (දිගුව 11902)
විද්‍යුත් තැපෑල - cpd@slaf.gov.lk / acpot@slaf.gov.lk

SELACINE

**සභාපති**
**ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**
**ආරක්ෂක අමාත්‍යාංශය**